''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 3051-4924
https://journals.sjp.ac.lk/index.php/pumithiri
වෙළුම: 2; I කලාපය; 2025 මාර්තු; පිටු: 3-14

# ශ්‍රී ලංකා දේශපාලන සන්දර්භය තුළ එක්සත් ජාතික පක්ෂයේ නව ප්‍රවණතා පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

කේ. බී. සී. මධුෂාන්[1] සහ වී. එස්. සූරියබණ්ඩාර[2]
[1] පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය;
[2] දේශපාලන විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
mkandabadage@sjp.ac.lk

**සංක්ෂේපය**

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ වර්ධනයේ වැදගත් කාලපරිච්ඡේදය සෝල්බරි අවධියයි. එහි වැදගත් අවස්ථාව එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමයි. පක්ෂය බිහිවී 2020 වන තෙක්ම ආණ්ඩු බලය හෝ විපක්ෂයේ හිදිමින් අධිපති ද්විපක්ෂ ක්‍රමයේ ප්‍රරෝගාමියෙකු වුවත්, ඉන් පසු පැවැත්වූ සෑම මැතිවරණයකදීම පක්ෂයේ ඡන්ද පදනම අවම විය. එහෙයින් වර්තමාන ශ්‍රී ලංකා පක්ෂ ක්‍රමය තුළ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අවම වී ඇත්තේ ඇයි ද? යන්න පර්යේෂණ ගැටලුව විය. පක්ෂයේ ඡන්ද පදනම අවමවීමට බලපෑ සාධක අධ්‍යයනය කිරීම අරමුණු කරගනිමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සාමාජීය විද්‍යාපීඨයේ දේශපාලන විද්‍යාව හදාරණු ලබන සිසුන් සහ පීඨයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවකයින් 10% වන සේ නියැදිය ගෙන දත්තදායකින් 35 දෙනෙකුගේ දත්ත මත පදනම්ව පර්යේෂණය සිදු කරන ලදී. දත්තදායකයින් තෝරාගැනීමේදී ස්ථරානුභූත නියැදුම් ක්‍රමය භාවිත කෙරිණ. දත්තදායකයින් වෙත විවෘත ප්‍රශ්න මාලාවක් දී එමඟින් දත්ත ලබාගන්නා ලදී. ලබාගත් ප්‍රමාණාත්මක දත්ත සංඛ්‍යාලේඛන විධික්‍රමය යටතේ MS Excel මෘදුකාංගය යටතේත්, ගුණාත්මක දත්ත ගුණාත්මක ප්‍රවේශය යටතේත් විග්‍රහ කිරීම සිදු විය. පක්ෂයේ ප්‍රබල නායකයින් නව දේශපාලන පක්ෂ ගොඩනගා ගැනීම, නායකත්ව අර්බුද, පක්ෂ අභ්‍යන්තරික ප්‍රජාතන්ත්‍රවාදය දුර්වල වීම හේතුවෙන් එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අවම වී ඇති බව සොයාගන්නා ලදී. පක්ෂයේ ප්‍රතිපත්තිමය වෙනසක් සිදුවිය යුතු බවත්, ගතානුගතික සහ සාම්ප්‍රදායික දේශපාලන ප්‍රතිපත්තිවලින් ඈත්ව අලුත් දේශපාලන සංස්කෘතික හරයන් පිරිණු ප්‍රජාතන්ත්‍රවාදී ජීවගුණයෙන් යුත් න්‍යාය පත්‍රයක අවශ්‍යතාවය පිළිබඳව පක්ෂය අවධානය යොමු විය යුතු බවත් අධ්‍යයනයේ දත්ත මත පෙන්වා දිය හැකිය.

**මුඛ්‍ය පද:** එක්සත් ජාතික පක්ෂය, දේශපාලන පක්ෂ, ප්‍රජාතන්ත්‍රවාදය, මැතිවරණ

## හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලනය, ශ්‍රී ලංකාවේ නූතන ප්‍රජාතන්ත්‍රවාදය වර්ධනය වීම කෙරෙහි සෘජු වශයෙන් බලපා තිබේ. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේදී බ්‍රිතාන්‍ය පාලකයින් විසින් මෙරටෙහි ක්‍රියාත්මක කරනු ලැබූ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාදාමය යටතේ ඇතැම් බටහිර ප්‍රජාතන්ත්‍රවාදී අංගයන් ස්ථාපනය වීමේ දිගු කාලීන ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සන්දර්භයක් නිර්මාණය වුවත් එම සන්දර්භය පූර්ණ වශයෙන් බටහිර ප්‍රජාතන්ත්‍රවාදය මෙන් සංවර්ධිත ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමයක් වූයේ නැත. එයට ප්‍රධානතම හේතුව වූයේ බටහිර දේශපාලන ක්‍රම මෙන් ශ්‍රී ලංකාවේ දේශපාලන ක්‍රමය සංවර්ධිත ආර්ථික ක්‍රමයක් මත පදනම් නොවීම ය. මෙසේ ශ්‍රී ලංකාවේ වර්ධනය වූ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන සන්දර්භය පසුගාමී ස්වභාවයක් දැරීම නිශ්චිත වශයෙන්ම දේශපාලන පක්ෂවල ස්වභාවය තීරණය වීම කෙරෙහි බලපෑවේය.

ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය වර්ධනය වී තිබෙන්නේ අසම්පූර්ණ ලෙසය. සමාජයෙහි සාම්ප්‍රදායික වැඩවසම් ලක්ෂණ සහ ධනේශ්වර ලක්ෂණ මිශ්‍ර වී පැවතීම ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන ක්‍රමය අංග සම්පූර්ණ ලෙස වර්ධනය නොවීමට ප්‍රබල සාධකයක් ලෙස බලපා තිබේ. එම පසුබිම දේශපාලන පක්ෂ කෙරෙහි සෘජු ලෙස බලපා ඇත. මෙම පසුබිම තුළ ලංකාවේ දේශපාලන පක්ෂ ශක්තිමත් ලෙස දේශපාලන ක්‍රමය තුළ තහවුරු වී නොමැති අතර එම දේශපාලන පක්ෂවල පරිණතභාවය ද පහළ මට්ටමක පවතී. විශේෂයෙන්ම

දේශපාලන මතවාදී ක්ෂේත්‍රයන්හි යථෝක්ත දුබලතාවය දේශපාලන පක්ෂ තුළින් විද්‍යමාන වේ. මින් අදහස් කරන්නේ ඇතැම් සුළු වාමාංශික පක්ෂ හැර ප්‍රධාන දේශපාලන පක්ෂවල නිශ්චිත ලෙස තහවුරු වූ දේශපාලන මතවාද හඳුනා ගැනීමට නොලැබීම ය. එහෙයින් ප්‍රධාන දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති සහ වැඩපිළිවෙල අවිනිශ්චිත ස්වභාවයක් ගනි.

ශ්‍රී ලංකාවේ යටත් විජිත සමයේ සිදු කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ මගින් පළාත්බද නියෝජනයත්, ඡන්ද බලය පුළුල් වීමත් සිදු විය. 1931 දී සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම ජනතාවගේ දේශපාලන සහභාගීත්වය වර්ධනයට මෙන්ම දේශපාලන පක්ෂ බිහි වීමට ද බලපෑ එක් සාධකයක් විය (De Silva, 1993). අනෙක් කාරණාව නම් ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට මූලික පදනම සකස් වූයේ මෙම ආණ්ඩු ක්‍රමය මඟිනි.

බටහිර යුරෝපයේ සහ උතුරු ඇමරිකානු කලාපවල දේශපාලන පක්ෂ බිහි වී අඩ සියවසක් ගත වීමෙන් පසු ලංකාවේ දේශපාලන පක්ෂවල ප්‍රභවය සිදු වී තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රථම දේශපාලන පක්ෂය වූ ලංකා සම සමාජ පක්ෂය බිහි වූයේ 1935 දීය. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂවල වර්ධනයේ වැදගත් අවස්ථාවක් වූයේ 1946 සැප්තැම්බර් 6 වන දින ඩී.එස්. සේනානායක මහතාගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමයි. සෝල්බරි ආණ්ඩුක්‍රමයේ මුල් කාල පරිච්ඡේදය තුළ එක්සත් ජාතික පක්ෂය බිහි වී තිබේ. සෝල්බරි ආණ්ඩුක්‍රමය කැබිනට් පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක් වූ අතර එම ආණ්ඩුක්‍රමය ක්‍රියාත්මක වීමට දේශපාලන පක්ෂවල පැවැත්ම අත්‍යවශ්‍ය විය. එම අවශ්‍යතාවය මත එක්සත් ජාතික පක්ෂය බිහි කරගත් අතර ඒ සඳහා ලංකා ජාතික සංගමයත්, මුස්ලිම් කොංග්‍රසය සහ සිංහල මහා සභාවත් එක්ව කටයුතු කරන ලදී (Wilson, 1979). එක්සත් ජාතික පක්ෂය ගොඩනැගීමත් සමඟ ලංකාවේ ප්‍රබල දේශපාලන පක්ෂය වශයෙන් සෑම මැතිවරණයකදීම මෙම පක්ෂය කැපී පෙනුනි. මෑතක් වන තුරුම පක්ෂ දේශපාලනය තුළ කොතරම් දේශපාලන පක්ෂ බිහිවුවත් මෙම පක්ෂයට සැලකිය යුතු ඡන්ද පදනමක් පැවතුණි. නමුත් සමගි ජන බලවේගය ගොඩනැගීමත් සමඟ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අඩු වී ප්‍රධාන පක්ෂය සුළු පක්ෂයක් බවට පත් වීමේ නව ප්‍රවණතාවයක් දැකිය හැකිය.

2020 පාර්ලිමේන්තු මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අවම මට්ටමකට පැවතුණි. මැතිවරණ කොට්ඨාස 22 න් (ආසන 196 න්) එක්සත් ජාතික පක්ෂයට ජාතික ලැයිස්තුවෙන් පමණක් එක් ආසනයක් හිමි විය. එහෙයින් වර්තමානයේ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම ඉතා අවම මට්ටමක පවතී. 2024 දී ජනාධිපති අපේක්ෂකයෙකු නම් කිරීමට පවා මෙම පක්ෂයට නොහැකි විය. සෑම මහ මැතිවරණයකදීම සහ ජනාධිපතිවරණයකදීම පෙරමුණගත් මෙම ප්‍රධාන පක්ෂයට හිමි වූයේ තෙවන තැනය. එය ද සන්ධානගතව ලබාගත් ඡන්ද නිසාවෙනි. එබැවින් මෙම ඡන්ද පදනම අවම වීම කෙරෙහි බලපෑ හේතු සහ නව ප්‍රවණතා අධ්‍යයනය කිරීම අරමුණු කරගනිමින් මෙම පර්යේෂණය සිදු කරන ලදී.

**පර්යේෂණ ගැටලුව**

සෝල්බරි අවධියේදී ගොඩනැගුණු එක්සත් ජාතික පක්ෂය සෑම මැතිවරණයකදීම අනෙකුත් පක්ෂවලට සාපේක්ෂව ඡන්ද පදනම වර්ධනය කරගනිමින් වසර 70 -76 ක් පමණ කාලයක් ශ්‍රී ලංකාවේ ආණ්ඩු බලය හසුරුවනු ලැබීය. එහෙත් 2020 මහමැතිවරණයේදී මෙම පක්ෂය, අනෙකුත් දේශපාලන පක්ෂවලට සාපේක්ෂව පසුබෑමකට ලක් වී තිබේ. වර්තමානයේ පක්ෂයේ නව ප්‍රවණතාවය එයයි. එබැවින් වර්තමාන ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමය තුළ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අවම වී ඇත්තේ ඇයි ද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ගැටලුව විය.

**පර්යේෂණ අරමුණු**

i. එක්සත් ජාතික පක්ෂයේ ආරම්භය සහ විකාශනය පිළිබඳව අධ්‍යයනය කිරීම.
ii. එක්සත් ජාතික පක්ෂය තුළ නායකත්වය සම්බන්ධව පවතින ගැටලු සහ කණ්ඩායම් ඉවත්වයාම පිළිබඳව අධ්‍යයනය කිරීම.
iii. වර්තමානයේ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අවම වීමට බලපාන හේතු සාධක අධ්‍යයනය කිරීම.

**සාහිත්‍ය විමර්ශනය**

ශ්‍රී ලංකාවේ පවතින දේශපාලන පක්ෂ ගැන මෙතෙක් සිදු කර ඇති පර්යේෂණ පිළිබඳව මෙහිදි අවධානය යොමු කරන අතර එම අධ්‍යයනවලින් දේශපාලන පක්ෂ පිළිබඳව හෙළිකරගත් කරුණු මෙන්ම එම පර්යේෂණවල රික්තකයක් හඳුනාගැනීම මෙහි අරමුණ විය.

Neil De Votta නැමති පර්යේෂකයා විසින් රචිත Parties, political decay and democratic regression in Sri Lanka නම් පර්යේෂණ ලිපියෙහි දක්වා ඇති ආකාරයට ලංකාවේ දේශපාලන පක්ෂ ප්‍රතිපත්ති ජනවාර්ගික කේන්ද්‍රවාදයටත්, සිවිල් යුද්ධයටත් හේතු වී ඇත. එමගින් ප්‍රජාතන්ත්‍රවාදී පසුබෑමක් සහ රට ඒකාධිපති පාලනයකට ගෙනගොස් ඇති බවත් විග්‍රහ කර තිබේ. බ්‍රිතාන්‍ය යුගයේදී ද්‍රවිඩ ජනයාට වැදගත් තැනක් නොලැබුණු බවත්, සිංහල නායකයන් දේශපාලනය තුළ වැදගත් පිරිස වූ බවත් එමගින් ජාතිවාදී දේශපාලනයක් ඉස්මතු වන බවද දක්වා තිබේ. එමඟින් සිදු වූයේ සිවිල් යුද්ධයක් දක්වා මෙම ගැටලුව ව්‍යාප්ත වීමය. (De Votta, 2014). මෙමගින් පක්ෂ ප්‍රතිපත්ති, දේශපාලන පක්ෂවල ස්වභාවය පිළිබදව විමර්ශනය කර ඇතත් එක්සත් ජාතික පක්ෂයේ නව ප්‍රවණතා පිළිබඳව අධ්‍යයනයක් සිදු කර නැත.

A.R.M. Imtiyaz and Ben Stavis නම් පර්යේෂකයන් විසින් රචිත Ethno-Political Conflict in Sri Lanka නැමති පර්යේෂණ ලිපියෙහි ලංකාවේ දේශපාලන පක්ෂ සම්බන්ධව දීර්ඝ විශ්ලේෂණයක් සිදු කර තිබේ. දේශපාලන පක්ෂ විසින් ජනවාර්ගික ප්‍රශ්න දේශපාලනීකරණයට ලක් කරන බවත්, දේශපාලන ප්‍රභූන් තම අභිප්‍රාය ඉටු කර ගැනීමට ජනවාර්ගික හැගීම් භාවිතා කරන බවත් එහි සදහන් වේ. ශ්‍රී ලංකාවේ ආගම, සංස්කෘතිය, භාෂාව දේශපාලන සමඟ සම්බන්ධ වී ඇති ආකාරයත්, ප්‍රධාන පක්ෂවල ප්‍රතිපත්ති ජාතිවාදී පදනමින් ගොඩනැගීමත් නිසා ලංකාවේ ජනවර්ග අතර ගැටලු නිර්මාණය වීමට එය හේතු වී ඇත (Imtiyaz and Stavis, 2008). ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ සම්බන්ධව බොහෝ අදහස් ඉදිරිපත් කර තිබුණත් එක්සත් ජාතික පක්ෂයේ පසුබෑම මෙකල දක්නට නොලැබුණි.

Miriam Fendins Elaman and Carolyn M.Warner යන පර්යේෂකයින් විසින් රචිත Democracy, Security and Religious Political Parties: A Framework for Analysis නැමති පර්යේෂණ ලිපියෙහි ශ්‍රී ලංකාවේ ආගමික දේශපාලන පක්ෂ කෙරෙහි ප්‍රජාතන්ත්‍රවාදයේ බලපෑම විශ්ලේෂණය කර ඇති අතර ආගමික දේශපාලන පක්ෂ සම්බන්ධව වැඩි අවධානයක් යොමු කර තිබේ. ආරාක්ෂාව සහ ප්‍රජාතන්ත්‍රවාදයට ආගම බලපෑම් කර ඇති නිසා එමගින් ජාතිවාදී අදහස් ඉස්මතු වීම වැලැක්විය නොහැකිය. සංසන්දනාත්මක සහ කලාපීය ප්‍රවේශයක් භාවිතා කරමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී (Elman and Warner, 2008). එහෙත් මෙම පර්යේෂණය මඟින් ලංකාවේ ප්‍රධාන දේශපාලන පක්ෂවල නව ප්‍රවණතා සහ දේශපාලන පක්ෂ නායකත්වයේ ගැටලුකාරීත්වය සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත්තේ ඉතා සීමිත ආකාරයට ය.

ශ්‍රී ලංකාවේ යටත් විජිත යුගය තුළ දේශපාලන පක්ෂ බිහි වීම සහ නිදහසින් පසු ලංකාවේ දේශපාලන පක්ෂවල වර්ධනය පිළිබඳවත්, විවිධ ආණ්ඩු යටතේ දේශපාලන පක්ෂවල ප්‍රතිපත්ති පිළිබඳව සහ පක්ෂ ක්‍රියාකලාපය, මැතිවරණ ඉතිහාසය යනාදිය සම්බන්ධයෙන් අධ්‍යයනයන් සිදු කර තිබුණද, එක්සත් ජාතික පක්ෂයේ නව ප්‍රවණතාව හෙවත් පක්ෂ ක්‍රමය තුළ සුළු පක්ෂයක් බවට පත්වීම සිදු වූයේ 2020 අගෝස්තු 5 පැවති පාර්ලිමේන්තු මැතිවරණයෙන් අනතුරුවය. මේ සම්බන්ධව වර්තමානයේ බොහෝ අවධානයට ලක්ව තිබුණත් එය අධ්‍යයනය කිරීම අල්ප වශයෙන් සිදු වී තිබේ. නමුත් මෙම අධ්‍යයනය මඟින් එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අඩුවීම, ඒ සඳහා බලපාන හේතු සහ සුළු පක්ෂයක් බවට මෙම පක්ෂය පත් වීම යනාදිය සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීමට බලපොරොත්තු වූ බැවින් එම රික්තකය පිරවීම සඳහා මෙම අධ්‍යයනය කාලෝචිත වන බව පැහැදිළිය.

**පර්යේෂණ ක්‍රමවේදය**

***අධ්‍යයන ප්‍රදේශය***

මෙම අධ්‍යයනයේදී අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තෝරා ගන්නා ලදී. එයට හේතුව නව දැනුමින් සහ නව දැනුම සොයායන විද්‍යාර්ථයින් මෙන්ම විවිධ සමාජ කාණ්ඩයන්ට අයත් පිරිසක් ඒකරාශී වී ඇති ස්ථානයක් වීමය. එම කණ්ඩායම්වල පවතින දේශපාලන දැනුම් මට්ටම් විවිධාකාර වන අතර පහසුවෙන් සෑම කණ්ඩායමක්ම නියෝජනය වන පරිදි නියදිය සකස් කර ගැනීම උදෙසා අධ්‍යයන ප්‍රදේශය වශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය තෝරා ගන්නා ලදී.

***නියැදිය***

අධ්‍යයනයේ නියැදිය සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨයේ දේශපාලන විද්‍යා අධ්‍යයනාංශයේ දේශපාලන විද්‍යා උපාධි අපේක්ෂක සිසුන් සහ පීඨයේ අනධ්‍යයන සේවකයින් ඇතුළත් වේ.

o දේශපාලන විද්‍යා උපාධි අපේක්ෂකයින් - 153

○ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින් - 197

350

නියැදිය තෝරාගැනීම සඳහා ස්ථරානුභූත නියැදුම් ක්‍රමය භාවිත කෙරිණි. ඒ අනුව සමස්ත සංගහනයෙන් අපේක්ෂිත නියැදිය තෝරාගැනීම සඳහා 10% ක ප්‍රතිශතයක් යොදා ගන්නා ලදී. ඒ අනුව,

නියැදිය $350 \times \frac{10}{100}$

$= 35$

ස්ථරානුභූත නියැදුම් ක්‍රමය යටතේ අපේක්ෂිත නියැදිය තෝරාගැනීම පහත පරිදි සිදු විය.

දේ.වි. උපාධි අපේක්ෂකයින් $153 \times \frac{10}{100} = 15$

අනධ්‍යයන සේවකයින් $197 \times \frac{10}{100} = 20$

$= 35$

ඒ අනුව අධ්‍යයනය සඳහා සමස්ත නියැදිය දත්ත දායකයින් 35 දෙනෙකි.

සමස්තයෙන් එක් එක් ස්ථරයට අදාළ දත්තදායකයින් සංඛ්‍යාව තෝරාගැනීම සඳහා අනතුරුව විනිශ්චය සඳහා වන නියැදුම් ක්‍රමය තෝරාගන්නා ලදී.

***දත්ත එක් රැස්කිරීම***

**ප්‍රාථමික මූලාශ්‍රය භාවිතය**

නියැදියට අනුව තොරතුරු ලබා ගැනීමේදී ප්‍රශ්නමාලා සහ සම්මුඛ සාකාච්ඡා යන සමාජ විද්‍යාත්මක ක්‍රමවේද භාවිතා කරන ලදී. මෙහිදී විවෘත ප්‍රශ්න මාලාවක් සකස් කර එය 15 ක් වූ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මෙන්ම, 20 ක් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයින්ට ලබා දී තොරතුරු ලබාගැනීම සිදු වූ අතර තවදුරටත් සම්මුඛ සාකච්ඡා ක්‍රමය මඟින් ද ඔවුන්ගෙන් තොරතුරු ලබාගන්නා ලදී.

**ද්විතික මූලාශ්‍රය භාවිතය**

දත්ත එක්රැස් කිරීමේදී පසුගිය මැතිවරණයන්හි ප්‍රතිඵල වාර්තා, ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා සහ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශන ආදී රාජකාරීමය ලේඛන අධ්‍යයනය කිරීම සිදු විය. එමෙන්ම මැතිවරණ, පක්ෂ ක්‍රමය සහ ඡන්දදායක චර්යාව ආදිය පිළිබඳව න්‍යායාත්මක තොරතුරු ඇතුළත් ග්‍රන්ථ, සඟරා, අන්තර්ජාල ලිපි සහ පුවත්පත් ලිපි ආදී ද්විතික මූලාශ්‍ර භාවිතා කරමින් පර්යේෂණයට අදාළ තොරතුරු ලබාගන්නා ලදී.

***දත්ත විශ්ලේෂණය කිරීම***

**ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය**

පර්යේෂණයට අදාළව ලබාගත් තොරතුරු විශ්ලේෂණය කිරීමේදී ප්‍රමාණාත්මක ක්‍රමවේදයන් භාවිතා කරනු ලැබීය. එහිදී දත්ත විශ්ලේෂණය සඳහා සංඛ්‍යාලේඛන විධික්‍රමය යටතේ Ms EXCEL මෘදුකාංගය භාවිතා කළ අතර සංඛ්‍යා විද්‍යාත්මක ක්‍රම ශිල්ප එනම් සංඛ්‍යා, ප්‍රතිශත, දත්ත වගු සහ ප්‍රස්ථාර සටහන් භාවිතා කරමින් විශ්ලේෂිත දත්ත නිරූපණය කරනු ලදී.

**ගුණාත්මක දත්ත විශ්ලේෂණය**

ගුණාත්මක දත්ත විශ්ලේෂණයේදී ප්‍රමාණාත්මක වශයෙන් විග්‍රහ කළ නොහැකි දත්තයන් ගුණාත්මක ප්‍රවේශය යටතේ විග්‍රහ කිරීමටත්, රැස් කරගනු ලැබූ දත්ත තුළ ගැබ්වී ඇති ගුණාත්මක අගයන් ඉස්මතු කිරීම සඳහා විස්තරාත්මක ප්‍රවේශයකින් විශ්ලේෂණය කිරීමත් සිදු කරනු ලැබීය.

**සාකච්ඡාව සහ විශ්ලේෂණය**

ශ්‍රී ලංකාවේ පැරණිතම දේශපාලන පක්ෂයක් සහ ආණ්ඩුබලය මෙහෙය වූ ප්‍රධාන දේශපාලන පක්ෂයක් වශයෙන් එක්සත් ජාතික පක්ෂය හඳුනාගත හැකිය. එක්සත් ජාතික පක්ෂය බිහිවීමත් සමඟ ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය තුළ ප්‍රමුඛ පක්ෂයක් බවට එය පත් විය. ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණය පැවත්වූයේ 1947 වසරේ දීය. මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය හැරුණු විට මැතිවරණයේ ප්‍රධාන තරඟකරුවන් වූයේ වාමාංශික පක්ෂ වූ ලංකා සමසමාජ පක්ෂය සහ ලංකා කොමියුනිස්ට් පක්ෂයයි.

මැතිවරණයෙන් වැඩිම ආසන සංඛ්‍යාවක් (ආසන 42 ක්) එක්සත් ජාතික පක්ෂයට හිමි වුවත් එය පාර්ලිමේන්තුවේ බහුතරය නොවීය. 1947 පැවති මහමැතිවරණයේදී ස්වාධීන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව ඉහළයාම (මැතිවරණයට ඉදිරිපත් වූ ස්වාධීන අපේක්ෂකයින් 182 අතුරින් දිනාගත් ආසන සංඛ්‍යාව 21කි) සහ වාමාංශික දේශපාලන පක්ෂ මැතිවරණයේදී සැලකිය යුතු ආසන සංඛ්‍යාවක් (ආසන 18) දිනා ගැනීම එක්සත් ජාතික පක්ෂයේ ආසන සංඛ්‍යාව අවම වීමට හේතු විය. එහෙයින් සුළු පක්ෂ කිහිපයක් සහ ස්වාධීන මන්ත්‍රීවරුන්ගේ සහයෝගයෙන් සභාග ආණ්ඩුවක් පිහිටුවා ගැනීමට එක්සත් ජාතික පක්ෂයට සිදු විය. ලංකා කම්කරු පක්ෂය (ආසන 01) සහ සමස්ත ලංකා ද්‍රවිඩ සංගමය (ආසන 07) එක්සත් ජාතික පක්ෂය සමඟ සභාග

ආණ්ඩුවට සම්බන්ධ වූ අනෙකුත් දේශපාලන පක්ෂ විය.

එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිමය ගැටලුවක් හේතුවෙන් ඉන් ඉවත් වූ ඇස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක ඔහුගේ නායකත්වයෙන් 1951 සැප්තැම්බර් 02 වන දින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවනු ලැබීය. ඒ වන විට ග්‍රාමීය ප්‍රදේශවල බහුතර සිංහල ජනතාවගේ ප්‍රශ්න, සුභසාධන කටයුතු සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ අවධානය අවම වීමත් සමඟ එක්සත් ජාතික පක්ෂය පිළිබඳව තිබූ දැඩි විශ්වාසීභාවය ජනතාව අතර අඩුවන්නට විය. වාමාංශික ව්‍යාපාරය ද අවධානය යොමු කරනු ලැබුවේ කම්කරු පන්තිය පිළිබඳව පමණි. 1951 දී ඇති වූ කෙටිකාලීන ආර්ථික උත්පාතය හේතු කොටගෙන (Snodgrass, 1966) රාජ්‍ය සුභසාධනය ඉහළ නැංවීමේ ආර්ථික හැකියාව ඇති වූ අතර එම තත්ත්වය උපයෝගී කර ගනිමින්, විශේෂයෙන්ම ග්‍රාමීය ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් ලබාදීම අරමුණු කරගෙන බණ්ඩාරනායක විසින් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පිහිටුවන ලදී (Warnapala, 2001). නමුත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගොඩනැගුණත් පැවති එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අඩු වී එය සුළු පක්ෂයක් බවට පත් වූයේ නැත. විශේෂයෙන්ම 1952 මැතිවරණයෙන් ජයග්‍රහණය කළේ ද එක්සත් ජාතික පක්ෂයයි. 1956 මහමැතිවරණයේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ මහජන එක්සත් පෙරමුණ මැතිවරණයෙන් ජයග්‍රහණය කිරීම අධිපති ද්වි සහාග පක්ෂ ක්‍රමයේ ආරම්භය මෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබල ප්‍රතිවාදියා බවට එම පක්ෂය පත්විය.

1970 න් පසුව මැතිවරණවලදී ස්වාධීන මන්ත්‍රීවරුන් තේරීපත් නොවීම සහ වාමාංශික දේශපාලන පක්ෂවලට අවම ඡන්ද සංඛ්‍යාවක් හිමි වීම හේතුවෙන් එක්සත් ජාතික පක්ෂයේ සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඡන්ද පදනම වර්ධනයට හේතු වී තිබේ. 1947 සිට 1977 දක්වා ලංකාවේ මහමැතිවරණ සරල බහුතර නියෝජන ක්‍රමයට අනුව පැවතුණු අතර, 1978 න් පසුව මහමැතිවරණ පැවැත්වූයේ සමානුපාතික නියෝජනය යටතේය. මෙම නියෝජන ක්‍රම දෙක යටතේ පැවති සෑම මැතිවරණයකදීම එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුබලය ලබාගැනීම සහ විපක්ෂය බවට පත් වෙමින් 2020 දක්වා දේශපාලන සන්දර්භය තුළ ප්‍රධානතම පක්ෂයක් බවට පත්ව තිබුණි. නමුත් එක්සත් ජාතික පක්ෂයට පැවති එම ශක්තිමත්භාවය 2020 න් පසුව අවම වීම දැකිය හැකිය.

වගුව 1: 1947 සිට 2020 දක්වා පැවති මහමැතිවරණවල එ.ජා.ප.ය ලබාගත් ඡන්ද සංඛ්‍යාව, ඡන්ද ප්‍රතිශතය සහ ආසන සංඛ්‍යාව

| වර්ෂය | එ.ජා.ප.ය ලබාගත් ඡන්ද සංඛ්‍යාව | ඡන්ද ප්‍රතිශතය | ආසන සංඛ්‍යාව |
|---|---|---|---|
| 1947 | 751,432 | 39.81% | 42 |
| 1952 | 1,026,005 | 44.08% | 54 |
| 1956 | 738,810 | 27.91% | 08 |
| 1960 | 909,043 | 29.89% | 50 |
| 1960 ජූලි | 1,143,290 | 37.57% | 30 |
| 1965 | 1,590,929 | 39.3% | 66 |
| 1970 | 1892525 | 37.9% | 17 |
| 1977 | 3179221 | 50.92% | 140 |
| 1989 | 2,838,005 | 50.71% | 125 |
| 1994 | 3,498,370 | 44.04% | 94 |
| 2000 | 3477770 | 40.21% | 89 |
| 2001 | 4086026 | 45.62% | 109 |
| 2004 | 3504200 | 37.83% | 82 |
| 2010 | 2357057 | 29.34% | 60 |
| 2015 | 5098916 | 45.66% | 106 |
| 2020 | 249,435 | 2.15% | 1 |

මූලාශ්‍රය: මැතිවරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව (1947-2020)

ඉහත මැතිවරණවල ප්‍රතිඵලවලින් ගම්‍ය වන්නේ 1947 සිට 1977 දක්වාත් ඉන් පසු සමානුපාතික නියෝජන ක්‍රමය යටතේත් ප්‍රධාන පක්ෂයක් වූ එක්සත් ජාතික පක්ෂයට විශාල ඡන්ද පදනමක් හිමිවන බවයි. 1977 මහමැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයට 5/6 ක ප්‍රබල බලයක් හිමි විය. එනම් එවක පැවති ජාතික රාජ්‍ය සභාවේ ආසන 168 න් 140 ක් ම හිමි වූයේ එක්සත් ජාතික පක්ෂයට ය. නමුත් 2020 මහමැතිවරණයෙන් එක්සත් ජාතික පක්ෂයට හිමි වූයේ ඉතාම අඩු ඡන්ද ප්‍රමාණයක් බවත් ඉහත වගුව 1 ට අනුව පැහැදිළි වේ. සන්ධානගත වෙමින් හෝ එක්සත් ජාතික පක්ෂය තම ඡන්ද පදනම වර්ධනය කරගන්නට නිරන්තරයෙන් උත්සාහ කරමින් සිටි.

එක්සත් ජාතික පක්ෂය මුල් අවධියේ දෘෂ්ටිවාදීමය වශයෙන් කොන්සර්වේටිව් දක්ෂිණාංශික මතවාදය

දැරූ අතර එහෙත් 1970 දශකයේදී නව ලිබරල්වාදී මතවාදයට නැඹුරු වීමක් දැකිය හැකිය. මුල්කාලීනව එක්සත් ජාතික පක්ෂය සමාජවාදයෙන් ප්‍රජාතන්ත්‍රවාදය සහ ආගම ආරක්ෂා කිරීමේ සටන් පාඨය අනුගමනය කරනු ලැබුවත් පක්ෂයට පැහැදිළි දර්ශනයක් සහ දැඩි විනයක් තිබුනේ නැත. බටහිර රාජ්‍යයන්ට පක්ෂපාතී, කොමියුනිස්ට් විරෝධී විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කළ එක්සත් ජාතික පක්ෂය මෙහෙය වනු ලැබුවේ ධනපති පන්තිය විසිනි. බටහිර ප්‍රජාතන්ත්‍රවාදය කෙරෙහි පූර්ණ විශ්වාසය තැබූ එක්සත් ජාතික පක්ෂය නිදහස් වෙළඳපොළ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළේය (Wilson, 1979). එසේ වුවද 1960 ගණන් වන විට එතෙක් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවලින් ක්‍රියාත්මක කරන ලද රාජ්‍ය ධනවාදී ආර්ථික අංගයක් එලෙසම පවත්වාගෙන යාමට ද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කටයුතු කරන ලදී (Wilson, 1979).

1973 දී ජේ.ආර්. ජයවර්ධනගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය නව ලිබරල්වාදය කරා නැඹුරු විය. එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වූයේ 1977 එක්සත් ජාතික පක්ෂය ආණ්ඩු බලය ලබාගැනීමත් සමඟය. විශේෂයෙන්ම විවෘත ආර්ථික ප්‍රතිපත්තිය මඟින් පෞද්ගලික ව්‍යවසායකයින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් කිරීමෙන් රැකියා උත්පාදනය සහ ආර්ථික වර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට කටයුතු කර තිබේ (Warnapala, 2001).

1978 න් පසුව පැවති සෑම ජනාධිපතිවරණයකදීම එක්සත් ජාතික පක්ෂයට හෝ එම පක්ෂය මූලික කරගත් සන්ධානයට විශාල ඡන්ද පදනමක් හිමි වී ඇති බව ඡන්ද ප්‍රතිඵල නිරීක්ෂණයෙන් පැහැදිළි වේ. නමුත් 2024 ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය මූලික කරගත් සන්ධානයට හිමි වූයේ අවම ඡන්ද ප්‍රමාණයකි. එම පක්ෂය තෙවන ස්ථානයට පත් වීම ඉන් සිදු විය.

වගුව 2: ශ්‍රී ලංකාවේ පැවති ජනාධිපතිවරණවල එක්සත් ජාතික පක්ෂය ලබාගත් ඡන්ද සංඛ්‍යාව

| මැතිවරණය පැවැත් වූ වර්ෂය | සමස්ත වලංගු ඡන්ද සංඛ්‍යාව සහ ඡන්ද ප්‍රතිශතය | එක්සත් ජාතික පක්ෂය ලැබූ ඡන්ද සංඛ්‍යාව සහ ඡන්ද ප්‍රතිශතය |
|---|---|---|
| 1982 | 6,522,147 (81.06%) | 34,50,811 (52.91%) |
| 1988 | 5,094,774 (55.32%) | 2,569,199 (50.43%) |
| 1994 | 7,561,526 (73.31%) | 2,715,285 (35.91%) |
| 1999 | 8,435,754 (73.31%) | 3,602,748 (42.71%) |
| 2005 | 9,717,039 (73.73%) | 4,706,366 (48.43%) |
| 2010 | 10,495,451 (74.50%) | 4,173,185 (40.15%) |
| 2015 | 12,123,452 (98.85%) | 6,217,162 (51.28%) |
| 2019 | 13,252,499 (82.87%) | 5,564,239 (41.99%) |

මූලාශ්‍රයː මැතිවරණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා.ව (1982,1988,1994,1999,2005,2010,2015,2019)

2019 වසරේදී එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත් වූ සජිත් ප්‍රේමදාස ඇතුලු පිරිස සමගි ජනබලවේගය පිහිටුවා ගැනීමත් සමඟ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අවම වන ලදී. 2024 ජනාධිපතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ කණ්ඩායම ඉදිරිපත් වුවත් ඉන් රටට ජනාධිපතිවරයෙකු බිහි කරගැනීමට ඔවුන්ට හැකි වූයේ නැත. ඉතිහාසය අලුත් කරමින් වාමාංශික දේශපාලන පක්ෂයක් වූ ජාතික ජනබලවේගය තුළින් ජනාධිපතිවරයා පත් විය. දක්ෂිණාංශික පක්ෂ මගින් සිදු කිරීමට අපේක්ෂා කරන්නේ ඔවුන් පොදු සන්ධානයක් ගොඩනගමින් මහමැතිවරණයට මුහුණ දීමට ය.

මෑතකාලීනව මෙම පක්ෂයේ ඡන්ද පදනම අවම වීමට බලපාන සාධක පිළිබඳව සොයා ලැබීම සඳහා දත්තදායකයින් 35 ක් යොදාගනිමින් පර්යේෂණය සිදු කළ අතර ඔවුන්ගේ අදහස් පහත ආකාරයට විමසා බැලිම සිදු විය. ශ්‍රී ලංකාවේ විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරන දත්තදායකයින් 15 ක් වූ ශිෂ්‍යයන් අතුරින් වයස් සීමාව අවුරුදු 18-24 සීමාවේ පසුවන 13 දෙනෙකු සහ වයසස අවුරුදු 25-29 සීමාවේ පසුවන සිසුන් 02 දෙනෙකු යොදා ගැණුනි. ඔවුන්ගෙන් 11 දෙනෙකු ස්ත්‍රී පාර්ශ්වය වූ අතර එය ප්‍රතිශතයක් වශයෙන් 73% කි. පුරුෂ පාර්ශ්වය 04 කි. එය 26.6% ක ප්‍රතිශතයකි. විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂක දත්තදායකයින්ගෙන් 11 දෙනෙකු මෙතෙක් ඡන්දය භාවිතා කර නැත. ඉන් සිව් දෙනෙකු පමණක් ඡන්දය භාවිතා කර තිබේ. ඡන්දය භාවිතා කරනු ලැබූ ප්‍රතිශතය 27% කි. ඡන්දය භාවිතා නොකළ පිරිස 73% කි.

විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ද 20 දෙනෙකු මෙම පර්යේෂණයේ දත්තදායකයින් විය. ඉන් 09 දෙනෙකු පුරුෂයින් ද, කාන්තාවන් 11 ක් ද විය. ප්‍රතිශතයක් වශයෙන් පුරුෂ පාර්ශවයෙන් 45% ක් ද, කාන්තා පාර්ශවයෙන් 55% ක් ද මෙම පර්යේෂණය සඳහා තොරතුරු ලබාදෙන ලදී. මෙම දත්තදායකයින්ගෙන් 7 දෙනෙකු වයස අවුරුදු 25 - 29 අතර පසු වූවන් ය. ඉන් කාන්තාවන් 3 ක් ද, පුරුෂයින් 4 ක් ද විය. වයස අවුරුදු 18-24 ක් වූවන් බහුතරය විය. එනම් දත්තදායකයින් 09 දෙනෙකු එම වයස් කාණ්ඩයේ පසු විය. පුරුෂ පාර්ශවය නියෝජනය කරමින් 02 ක් ද, ස්ත්‍රී නියෝජනය 07 ක් ද විය. වයස අවුරුදු 30-39 අතර සීමාවන්වල දත්ත දායකයින් 04 දෙනෙකු විය. ඉන් කාන්තාවන් එක් අයෙකු සහ පුරුෂයින් 03 දෙනෙකු විය. සියළු දත්තදායකයන් උසස් පෙළ හදාරා තිබීම ඉතා වැදගත් ය. අනධ්‍යයන කාර්ය මණ්ඩලයට සේවකයින් බඳවා ගැනීමේ දී වුවද යම් අධ්‍යාපන මට්ටමකින් බදවාගැනීම ඉතා වැදගත් කාරණාවකි. සමස්තයක් වශයෙන් දත්ත දායකයින් 35 දෙනාගේ මූලික තොරතුරු පහත වගුව 3 හි දක්වා තිබේ.

වගුව 3: ප්‍රතිචාරකයාගේ මූලික තොරතුරු

| වයස | | | | | | | ස්ත්‍රී/පුරුෂ | | සිවිල් තත්ත්වය | | | | අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1) 18 අඩු | 2) 18 - 24 | 3) 25 - 29 | 4) 30 - 39 | 5) 40 - 49 | 6) 50 - 59 | 7) 60 ට වැඩි | 1) ස්ත්‍රී | 2) පුරුෂ | 1) විවාහක | 2) අවිවාහක | 3) දික්කසාද | 4) වැන්දඹු | සා. සමත් | උ. සමත් | උපාධි හෝ උසස් අධ්‍යාපනය |
| - | 22 | 9 | 04 | - | - | - | 22 | 13 | 7 | 28 | - | - | | 14 | 21 |

මූලාශ්‍රය: ක්ෂේත්‍ර අධ්‍යයනය, 2024

ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ පිළිබඳව මූලික දැනුම දත්තදායකයින්ට පවතින බවත්, එය සාධනීය මට්ටමක පවතින බවත් අධ්‍යයනයෙන් හෙළිවිය. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය බහුපක්ෂ ක්‍රමයක් බව සියලු දෙනාම පිළිගන්නා කාරණාවකි. ඇතැමුන් පෙන්වා දෙන්නේ බහුපක්ෂ ක්‍රමයක් වශයෙන් හැඳින්වුවත් සැබෑ ලෙසම පවතින්නේ ද්විසභාග පක්ෂ ක්‍රමයක් බවයි. එය ඉතා නිර්වද්‍ය වේ. ශ්‍රී ලංකාවේ බොහෝමයක් දේශපාලන පක්ෂ පැවතියත් ආණ්ඩුබලය මෑතක් වන තුරුම මෙහෙය වූයේ එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයයි. එහෙත් කිසිදු විටක ඔවුන් තනි පක්ෂයක් වශයෙන් මැතිවරණවලට ඉදිරිපත් වූයේ නැත. සභාග දේශපාලනය මත එම බලය ලබාගනිමින් ආණ්ඩු පවත්වාගෙන යන ලදී. ඒ අනුව ද්විසභාග පක්ෂ ක්‍රමයක් මෙරට පවතින බව බොහෝ අයගේ අදහසයි.

එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති පිළිබඳව උපාධි අපේක්ෂක දත්ත දායකයින්ගෙන් ලැබුණු ප්‍රතිචාරය සුබවාදී නැත. දත්තදායකයින් 14 දෙනෙකුම පෙන්වා දෙන්නේ එම ප්‍රතිපත්ති පිළිගැනීමට නොහැකි බවයි. එයට හේතුව පක්ෂ නායකත්වයේ පෞද්ගලික න්‍යාය පත්‍රවලට අනුව එම ප්‍රතිපත්ති සකස් කරන බව පෙන්වා දෙන ලදී. ජාතික ප්‍රතිපත්ති අභිබවා මෙම පෞද්ගලික ප්‍රතිපත්ති ඉදිරියට පැමිණ ඇති බව ඔවුන්ගේ අදහසයි. ඒ අනුව 93% කගේ අදහස වන්නේ එක්සත් ජාතික පක්ෂ ප්‍රතිපත්ති පිළිගත නොහැකි බවයි. අනධ්‍යන කාර්ය මණ්ඩලයේ ප්‍රතිචාර දැක්වූ දත්තදායකයින් 20 තුළින් 19 ක්ම පෙන්වා දෙන්නේ ද එක්සත් ජාතික පක්ෂයේ පක්ෂ ප්‍රතිපත්ති පිළිනොගන්නා බවයි. සමස්තයක් වශයෙන් දත්තදායකයින් 35 අතුරින් 33 ක් ම එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්ති නොපිළිගනි. එය ප්‍රතිශතයක් වශයෙන් 94% කි. ඔවුන් පෙන්වා දෙන්නේ පෞද්ගලික න්‍යාය පත්‍රවලට අදාළව දේශපාලන පක්ෂය විසින් තම ප්‍රතිපත්ති සකස් කරන බවත්, ඒවා රටට කිසිසේත්ම නොගැලපෙන බවය. එබැවින් ජාතික ප්‍රතිපත්තිවල වැදගත්කම අවධාරණය කළ යුතු බව දත්තදායක මතයයි.

එමෙන්ම එක්සත් ජාතික පක්ෂයේ බිහිවීම සහ එහි මුල් නායකයින් පිළිබඳව සමස්ථ දත්ත දායකයින්ගේ ප්‍රතිචාරය යහපත් විය. එයට හේතුව දත්ත දායකයින් 29 දෙනෙකු ප්‍රකාශ කරන්නේ එම මුල් නායකයින් පිළිබඳව සෑහීමකට පත් විය හැකි බවයි. එය ප්‍රතිශතයක් වශයෙන් 83%කි. ඩී.එස්. සේනානායක, ඩඩ්ලි සේනානායක වැනි නායකයින් විශිෂ්ටත්වයෙන් තම කාර්යයභාරය සිදු කළ බවත්, වර්තමානයේ මෙන් හොර මැර වංචා දූෂණ සිදු නොකර බවත් ඔවුන්ගේ අදහසයි. 1953 හර්තාලයත් සමඟ ඩඩ්ලි සේනානායකයන් අගමැති ධූරයෙන් ඉවත් වීමට තරම් ප්‍රජාතන්ත්‍රවාදී වූ බවත් ඇතැම් අයගේ ප්‍රතිචාරය විය. මෙහිදී රජය විසින් සිදු කළ සුබසාධන කප්පාදු කිරීමට එරෙහිව දැවැන්ත කැරැල්ලක් ලංකාවේ සෑම තැනකම සිදු විය. එමෙන්ම වාමාංශික ව්‍යාපාරය ශක්තිමත්ව එම අරගලය මෙහෙය වීම සිදු කරන ලදී. කෙසේ හෝ අගමැති ඉවත් වීමෙන් ඉතිරි නිලකාලය සඳහා ජෝන් කොතලාවල අගමැතිධූරයට පත් විය. රටේ මහජන මතයට ගරුකරමින් ඩඩ්ලි සේනානායකගේ ඉවත් වීම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස මෙම දත්ත දායකයින් පෙන්වා දෙන ලදී. නමුත් වර්තමානයේ කෙසේ හෝ බලයේ ඉන්නට උත්සාහ කරන පාලකයින්ට වඩා මෙම ආරම්භක නායකයින් වඩාත් සුදුසු බව මොවුන්ගේ අදහස විය.

එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා දීර්ඝ කාලයක් තිස්සේ පක්ෂයේ නායකයා වන අතර, නායකත්ව අර්බුදය පක්ෂයේ ප්‍රබල අභ්‍යන්තරික ගැටලුවක්ව පවති. එහෙත් එම නායකත්වය වෙනත් අයෙකුට ලබා දීමට වික්‍රමසිංහ මහතා කැමති වන්නේ නැති බව දත්ත දායකයින්ගේ අදහස විය. මෙම පක්ෂයේ ආරම්භක නායකයින් ගැන දත්තදායකයින් 06 දෙනෙකු සෑහීමකට පත් නොවේ. එය ප්‍රතිශතයක් වශයෙන් 7% කි. එයට හේතු වශයෙන් ඔවුන් පෙන්වා දෙන්නේ අතීත නායකයින් නිවරදිව තම පාලනය සිදු කළානම් වර්තමාන නායකයින් බලලෝභි නොවන බවය. රදළ පැළැන්තියෙන් බලය වෙනත් පාර්ශවයකට පත්වනවාට අතීත නායකයින් ද අකමැති වූ බව පෙන්වා දුනි.

එක්සත් ජාතික පක්ෂයේ නායකයින් පිළිබඳව තරුණ ප්‍රජාව අතර යම් මතභේදයක් පවති. එහි ආරම්භක නායකයින් සහ ඔවුන් අනුගමනය කරනු ලැබූ සුබසාධන වැඩසටහන් පිළිබඳව විශ්වවිද්‍යාල සිසුන්ගේ මතය වූයේ සෑහීමකට පත් විය හැකි බවයි. දත්තදායකයින් සියලු දෙනාම ඒකමතිකව එය පිළිගෙන ඇත. නමුත් විශ්වවිද්‍යාල අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ 17 දෙනෙකු එය අනුමත කළත්, තිදෙනෙකුගේ අදහස පිළිනොගන්නා බවයි. නමුත් සමස්ත දත්තදායකයින්ගෙන් 91% ක් සාධනීය ප්‍රතිචාරයක් දක්වා තිබේ. විශේෂයෙන්ම ඔවුන්ගේ අදහස නම් ඩී.එස්. සේනානායක රජය තුළ අනුගමනය කරනු ලැබූ සුබසාධන ප්‍රතිපත්තිය වැදගත් බවයි. දේශපාලනික සහ ජනසමාජය ඉහළ තත්ත්වයකට පත් කිරීම මෙම රජයේ ප්‍රතිපත්තිය බව ඔවුන්ගේ අදහස විය. කෘෂිකර්මාන්තය දියුණු කිරීමත්, එසේම රටේ ස්වෛරීභාවය පිළිබඳව අවධානය යොමු කිරීමත් මෙකල දක්නට ලැබුණු බව දත්තදායකයින්ගේ අදහස විය. සුළු ජාතීන් වෙනුවෙන් පෙනි සිටීමත්, ගොවිජනපද ව්‍යාපාරය හරහා ගොවියා ශක්තිමත් කිරීමට කටයුතු කිරීමත් මෙම කාලය තුළ සිදු වූ බව මොවුන්ගේ අදහසයි. ඩඩ්ලි සේනානායක මහතා ද ඉමහත් සේවාවක් සැපයූ එක්සත් ජාතික පක්ෂ මුල් නායකයෙක් වශයෙන් පෙන්වා දෙන ලදී. ඔහු කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිදුකළ සේවාව පිළිබඳව සෑහීමකට පත්විය හැකි බව දත්තදායකයින්ගේ අදහස විය. එසේම වගාසංග්‍රාමයක් ඇති කිරීම සහ ඔහු විසින් ලබා දුන් සුබසාධන වැඩපිළිවෙල සාර්ථක වූ හෙයින් "බත්දුන් පියා'' යන ගරුත්වයෙන් ඔහුට සැලකීමට ලක් ව තිබේ. එමෙන්ම ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරමින්, ජනතාව පක්ෂනායකයින්ට අකමැති වනවිට එහි තවදුරටත් නොසිට ඉන් ඉවත්ව යාම ඩඩ්ලිගේ නායකත්ව ගුණාංගයක් වශයෙන් පෙන්වා දී තිබේ. එක්සත් ජාතික පක්ෂයේ මුල් නායකයින් සහ ඔවුන්ගේ සුබසාධනයන් පිළිබඳව මෙම දත්ත දායකයින්ගේ අදහස සාධනීය වේ.

1977 න් පසු ජේ. ආර්. ජයවර්ධන මහතා හඳුන්වාදුන් විවෘත ආර්ථික ප්‍රතිපත්තිය බොහෝ සෙයින්ම දත්තදායකයින් විවේචනයට ලක් කරයි. එමගින් විදේශීය ආයෝජන ලංකාවට ගලා ආවත්, ඉන් ජාතික ආර්ථිකයට සිදු වූ විනාශය අධික බව දත්ත දායකයින්ගේ අදහස විය. තවද කෘෂිකර්මාන්තය වැනි දේශීය ආර්ථිකය විනාශ වීමට එක් හේතුවක් වශයෙන් ද මෙය පෙන්වා දී ඇත. දේශීය ගොවියන් ශක්තිමත් කිරීම වෙනුවට ජාත්‍යන්තරය තුළ අපගේ ආර්ථිකය හැල්ලුවට ලක්කිරීමක් වශයෙන් මෙම දත්තදායකයින් විවෘත ආර්ථිකය හඳුනාගෙන තිබේ.

1994 සිට එක්සත් ජාතික පක්ෂයේ නායකයා වශයෙන් රනිල් වික්‍රමසිංහ මහතා තවමත් රැඳීසිටීම පිළිබඳව මෙම දත්තදායකයින් පෙන්වා දෙන්නේ පක්ෂය තුළ යම් බිඳවැටීමකට අවස්ථාව සකස්කර දීමක් වශයෙනි. ප්‍රජාතන්ත්‍රවාදීව පක්ෂ නායකයින් විසින් කළ යුතු වන්නේ තම පක්ෂයෙන් පසුපෙළ නායකත්වයක් ගොඩනැගීමට කටයුතු කිරීමය. නමුත් එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය විසින් එම අවස්ථාව මගහරිමින් සිටි. ඔහු තවත් අයෙකුට කිසිදු අවස්ථාවක් ලබාදෙන්නේ නැත. 2019 දී වුවද එක්සත් ජාතික පක්ෂයෙන් ජනාධිපති අපේක්ෂකයා වශයෙන් සජිත් ප්‍රේමදාස මහතා පත්කරනු ලැබුවේ ද අර්බුද මධ්‍යයේ ය. පක්ෂ නායකත්වය සම්බන්ධයෙන් පැවති අර්බුද ක්‍රමක්‍රමයෙන් වර්ධනය වූ අතර එක්සත් ජාතික පාක්ෂිකයින් කැඩිබිඳී යන්නට පටන් ගැනීම ඉන් සිදු විය. අවසානයේදී එක්සත් ජාතික පක්ෂයෙන් සජිත් ප්‍රමුඛ පිරිස ඉවත් ව සමගි ජන බලවේගය නමින් නව දේශපාලන පක්ෂයක් බිහි කරගන්නා ලදී. වර්තමානයේ විපක්ෂය වශයෙන් කටයුතු කරන්නේ එම පක්ෂයයි.

එක්සත් ජාතික පක්ෂය 2020 මහමැතිවරණයේදී දරුණුතම පරාජයක් ලැබීමට නායකත්වය මෙන්ම පක්ෂ අර්බුද බලපෑ බව මොවුන්ගේ අදහසයි. ඒ අනුව පක්ෂ නායකත්වය මාරුනොවීම නිසා පක්ෂය බිඳවැටුණු බවට දත්තදායකයින් 26 දෙනෙකු පිළිගෙන ඇත. ඒ අනුව 74% ක් පෙන්වා දෙන්නේ පක්ෂයට නව නායකත්වයක් අවශ්‍ය බවයි. 09 දෙනෙකු පෙන්වා දෙන්නේ නායකත්වය, පක්ෂයේ බිඳවැටීමට බලපා නැති බවයි. ඔවුන් ප්‍රතිශතයක් වශයෙන් ගතහොත් 26% කි. මෙම පිරිසේ අදහස වන්නේ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය විසින් රට අර්බුදයෙන් බේරා ගැනීමට ඉදිරිපත් වීම නායකත්වයේ විශේෂ ගුණාංගයක් බවත් පෙන්වා දුනි. එවැනි දේශපාලන පරිනතභාවයක් අනෙකුත් නායකයින්ගෙන් දැකගැනීම ඉතා අවම බව මෙම 26% නියෝජනය කරන දත්තදායක අදහස විය.

එක්සත් ජාතික පක්ෂය වර්තමානයේ බිඳවැටීමට සමගි ජනබලවේගය හේතු වුයේද යන්න මෙහිදී සොයා බලන ලදී. දත්තදායකයින් 32 ක් එනම් 91% දෙනෙකුගේ අදහස වූයේ සමගි ජන බලවේගය ගොඩනැගීමත් සමඟ එක්සත් ජාතික පාක්ෂිකයින් ඒ වටා එක්රොක් වූ බවයි. 2020 මහමැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද ලක්ෂ දෙකකට සීමා කරමින්, සමගි ජන බලවේගය ඡන්ද ලක්ෂ 27 ක් දක්වා ලබාගත්තේ එක්සත් ජාතික පාක්ෂික ඡන්ද සමගි ජන බලවේගයට ලබාගනිමින් බව මොවුන්ගේ අදහස විය. 2020 මහමැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂයට ජාතික ලැයිස්තු මන්ත්‍රීධූරය හැරුණු විට කිසිදු ආසනයක් දිනාගැනීමට හැකි වූයේ නැත. එහෙත් සමගි ජන බලවේගය ආසන 54 ක් ලබා ගන්නා ලදී. ඉන් පැහැදිළි වන්නේ එක්සත් ජාතික පක්ෂයෙන් සජිත් ප්‍රමුඛ පිරිස වෙන් නොවුණේ නම් විපක්ෂය බවට පත් වන්නේ එක්සත් ජාතික පක්ෂය බවයි. එනිසා එක්සත් ජාතික පක්ෂයට ප්‍රබල පාඩුවක් වූයේ පක්ෂයේ නායකයින් මෙලෙස වෙන්ව යාමයි. නායකත්වයේ අර්බුදය මේ සඳහා බලපා ඇති බව දත්ත දායකයින්ගේ අදහස විය. නමුත් දත්තදායකයින් තිදෙනෙකු එනම් 9% ක් පමණක් පෙන්වා දෙන්නේ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම අවම වීම සඳහා සමගි ජන බලවේගය ගොඩනැගීම හේතුවක් නොවන බවයි. ඔවුගේ අදහස වූයේ සමස්ත එක්සත් ජාතික පක්ෂය පිළිබඳවම කලකිරීමකට පත් පාක්ෂිකයින් විසින් එක්සත් ජාතික පක්ෂය පරාජය කළා මිසක නව පක්ෂය බිහිවීම ඒ සඳහා බලපා නැති බවයි. අනෙක එක්සත් ජාතික පක්ෂයෙන් ඉහත නායකයින් වෙන් නොවුණත් එම ඡන්ද වෙනත් පක්ෂයකට හෝ ලබාදීමට ඉඩ පැවති බව මොවුන්ගේ අදහස විය.

වර්තමානයේ එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය සම්බන්ධයෙන් ඇති වී තිබෙන ගැටලු පිළිබඳව අධ්‍යයනය කිරීම මෙහිදි සිදු විය. එහිදී දත්තදායක දත්ත අනුව පක්ෂනායකත්වය තුළින් ඒකාධිපති ස්වභාවය පෙන්නුම් කරේ. තම පක්ෂයේ අනෙකුත් පසුපෙළ නායකයින්ට ඉස්මතු වීමට ඉඩ නොදෙන ස්වභාවයක් පෙන්නුම් කරන බවත් පැහැදිළි වේ. පක්ෂයේ ප්‍රතිපත්තිය තමන්ට අවශ්‍ය පරිදි පමණක් මෙහෙයවීමත්, අනෙක් මතවලට පක්ෂ අභ්‍යන්තරයේ ලැබෙන ඉඩ ප්‍රමාණය ඉතාම අවම බව දත්තදායක මතය වේ. අනෙක බලයට ඇති ලෝබීත්වයයි. එනම් බලය අතහැරීමට ඇති අකමැත්ත පක්ෂ නායකත්වය මගින් නිරූපණය වන බව ප්‍රකාශ කරනු ලැබීය.

මැතිවරණවලදි කොතරම් පරාජයට පත් වුවත් නැවත නැවත පක්ෂයේ අභ්‍යන්තරිකව ඇති ගැටලු නොවිසඳා පක්ෂ නායකත්වයේම රැඳී සිටීම ඒකාධිපති සහ බලලෝභීත්වය පෙන්වන තැනකි. එමෙන්ම හිතුවක්කාරී ස්වභාවයක් පක්ෂනායකත්වය මගින් දැකගතහැකි බවට දත්තදායකියන් විසින්

පෙන්වා දේ. පක්ෂයේ අභ්‍යන්තරිකව දැකිය හැකි ගැටලු ද නායකත්වයේ අර්බුදය නිර්මාණය කිරීමෙහිලා හේතුවන බව හෙළි වේ. 2024 ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වූ රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කළේ 2024 පැවැත්වීමට නියමිත මහමැතිවරණය සඳහා අනෙකුත් සියලු පක්ෂවල එකතුවෙන් ශක්තිමත් සන්ධානයක් මත තරඟ කරන බවයි. මින් පැහැදිළි වන්නේ තම නායකත්වය යටතේ ආණ්ඩුවක් ගොඩනැගීමට තවමත් ඔහු බලපොරොත්තුවෙන් සිටින බවයි. එනම් බලය අත් හැරීමට කිසිදු විටක ඔහු උත්සාහ නොකරන බවයි.

එක්සත් ජාතික පක්ෂයේ නායක රනිල් වික්‍රමසිංහ මහතා රටේ අනුප්‍රාප්තික ජනාධිපතිවරයා ලෙස 2022 දී පත් වූ අතර, ඔහු යම් ප්‍රමාණයකට රටේ පුරවැසි විශ්වාසය දිනාගැනීමට සමත් විය. ඒ අනුව ඔහු 2024 දී ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයෙකු වශයෙන් ද පෙනී සිටින ලදී. ඒ එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයා වශයෙන් නොව ස්වාධීන අපේක්ෂකයෙකු වශයෙනි. මෙම ස්වාධීන අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීම පක්ෂයේ ඇති බිඳවැටීම පෙන්නුම් කරන බව දත්තදායකයින්ගේ අදහසයි. ඒ අනුව විශ්වවිද්‍යාල දේශපාලන විද්‍යා උපාධි අපේක්ෂකයින් 15 අතුරින් 13 දෙනෙකුගේ අදහස වන්නේ ස්වාධීනව ඉදිරිපත් වීම පක්ෂයේ බිඳවැටීමට හේතුවන බවයි. අනධ්‍යන කාර්යමණ්ඩලයේ 16 දෙනෙකු එම අදහස පිළිගනී. ඒ අනුව සමස්ත නියැදියෙන් 29 දෙනෙකු හෙවත් 83% කගේ අදහස වූයේ ස්වාධීනව ජනාධිපති අපේක්ෂකයෙකු වශයෙන් ඉදිරිපත් වීම පක්ෂය බිඳවැටීමට ප්‍රබල වශයෙන් බලපා ඇති බවයි. එහෙත් 17% ක් පෙන්වා දෙන්නේ ස්වාධීනව ඉදිරිපත් වන්නේ ජනාධිපතිවරයා වශයෙන් ඔහු සිදුකරනු ලැබූ සේවාව හේතුවෙන් එක් පක්ෂයකින් පමණක් ඉදිරිපත් වීම දේශපාලනික වශයෙන් කොටුවීමක් නිසා බවයි. එබැවින් ජනාධිපතිවරයා වශයෙන් සිදුකරන ලැබූ ජාතික සේවාව හේතුවෙන් ස්වාධීනව ඉදිරිපත් වී ඇති බව මොවුන්ගේ අදහසයි.

2024 දී රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති අපේක්ෂකයෙකු වශයෙන් ස්වාධීනව ඉදිරිපත්ව ඡන්ද 2,299,767 (17.27%) ලබාගෙන තෙවන ස්ථානයට පත් විය. සමඟි ජනබලවේගය සහ එක්සත් ජාතික පක්ෂය එක්ව මැතිවරණයට මුහුණ දුන්නානම් නිසක ජය හිමි වන්නේ එක්සත් ජාතික පක්ෂයට බව මැතිවරණ ප්‍රතිඵල අනුව පෙනියන කාරණාවකි. ඒ අනුව ස්වාධීන අපේක්ෂකයෙකු වශයෙන් රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් වීමම පක්ෂයේ අර්බුදය කියාපායි. එනම් ලංකාවේ පක්ෂ ක්‍රමයක මුල්ම පක්ෂය වූයේ එක්සත් ජාතික පක්ෂයයි. එවැනි පක්ෂයක් තුළින් සෘජුවම අපේක්ෂකයෙකු ඉදිරිපත් කිරීමට නොහැකි වීම වර්තමානයේ පක්ෂය කොතරම් බිඳවැටීමකට හේතු වී තිබේද යන්න පැහැදිළි වේ. පක්ෂයේ අනාගතය පිළිබඳව අවිනිශ්චිතභාවයක් පවතී. එලබෙන මහමැතිවරණය සඳහා එක්සත් ජාතික පක්ෂය පෙරටු කරගත් නව සන්ධානයක් ගොඩනගන බව රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශ කර සිටියත් නැතිවී ගිය ඡන්ද නැවත සකස් කරගැනීමට පහසු කාර්යයක් නොවන බව පැහැදිළිය.

ඉහත කරුණු කාරණා අනුව එක්සත් ජාතික පක්ෂයේ වර්තමානය සහ අතීතය පිළිබඳවත්, පක්ෂ නායකත්වය සහ පක්ෂ ප්‍රතිපත්ති පිළිබඳවත් දත්තදායකයන්ගේ අදහස් පෙන්වා දිය හැකිය. එහිදි එක්සත් ජාතික පක්ෂයේ ආරම්භක නායකයින් ජනතාවගේ සුබසාධනයට මැදිහත් වෙමින්, ජාතික සේවාවන් රැසක් සිදු කර ඇති බවත් පෙන්වා දිය හැකිය. නමුත් 1977 න් පසුව එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිමය වෙනසක් සිදුවන අතර, නායකත්වයේ යම් යම් අර්බුද නිර්මාණය වන්නට ද පසුබිම සකස් වී තිබේ. 1994 සිට වර්තමානය දක්වාම එක් පක්ෂ නායකයෙක් යටතේ තවමත් පක්ෂය පවත්වාගෙන යන අතර, වර්තමානය තුළ පක්ෂය ප්‍රබල බිඳවැටීමකට ලක්ව තිබේ. පක්ෂ අභ්‍යන්තරික අර්බුදය තීව්‍ර වූ හෙයින් ප්‍රබල කණ්ඩායමක් 2020 දී එක්සත් ජාතික පක්ෂය අතහැර සමඟි ජන බලවේගය ගොඩනගා ගැනීම පක්ෂයට වූ දැවැන්ත බලපෑමකි. වර්තමාන නායකයා විසින් පක්ෂයට නැති වී ගිය ඡන්ද නැවත සකස් කරන්නට උත්සාහයක යෙදුනත්, එය ඉතා අපහසු කාර්යයක් බව කිව හැකිය.

එක්සත් ජාතික පක්ෂය වර්තමානයේ දී දේශපාලනික වශයෙන් පසුබෑමකට ලක්වී ඇති බවත්, මෙම පක්ෂයෙන් ප්‍රබලයින් ඉවත්ව ගොඩනගා ගන්නා ලද නව දේශපාලන පක්ෂ කෙරෙහි ජනතාව අවධානය යොමුකර ඇති බවත් පැහැදිළිය. එක්සත් ජාතික පක්ෂයේ පවතින නායකත්ව අර්බුදය, අභ්‍යන්තරික ප්‍රජාතන්ත්‍රවාදයක් නොමැති වීම, නායකත්වයේ පවතින ප්‍රභූවාදය, සමඟි ජන බලවේගය ගොඩනැගීම සහ ඒ වටා එක්සත් ජාතික පාක්ෂිකයින්

එක්වීම හේතුවෙන් පක්ෂයේ ඡන්ද ප්‍රමාණය අවම වීම දැකිය හැකිය.

## නිගමන සහ යෝජනා

එක්සත් ජාතික පක්ෂයෙන් සජිත් ප්‍රේමදාස මහතා ඇතුලු පිරිස ඉවත්වගොස් ගොඩනැගූ සමගි ජනබලවේගය හේතුවෙන් එම පක්ෂයේ ඡන්ද පදනම අඩු වූ බවත් තව දුරටත්, නායකත්ව අර්බුදය හේතුවෙන් එහි බොහෝ පිරිසක් එක්සත් ජාතික පක්ෂයෙන් ඉවත්ව සමගි ජන බලවේගය සමඟ එකතු වී තිබීම හේතුවෙන් එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද පදනම බිඳවැටී ඇති බවත් නිගමනය කළ හැකිය. නැවත මෙම කරුණු පිළිබඳව සලකා පක්ෂය ප්‍රතිසංස්කරණයකට ලක් නොවුණහොත් පක්ෂ දේශපාලනයෙන් එක්සත් ජාතික පක්ෂය ඉවත්ව යෑම බොහෝ විට සිදුවිය හැකි දෙයක් ලෙස පෙන්වා දිය හැකිය.

## යෝජනා

- එක්සත් ජාතික පක්ෂයේ ප්‍රතිපත්තිමය වෙනසක් සිදුවිය යුතුය. ප්‍රතිපත්ති කාලෝචිත සහ සාමාන්‍ය ජනතාව නියෝජනය වන ප්‍රතිපත්ති වීම අනිවාර්ය වේ. ගතානුගතික සහ සාම්ප්‍රදායික දේශපාලන ප්‍රතිපත්තිවලින් ඈත්ව අලුත් දේශපාලන සංස්කෘතික හරයන් පිරිණු ප්‍රජාතන්ත්‍රවාදී ජීවගුණයෙන් යුත් න්‍යාය පත්‍රයක අවශ්‍යතාවය පිළිබඳව පක්ෂයේ අවධානය යොමු විය යුතුය.
- පක්ෂය තුළ අභ්‍යන්තරික ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කළ යුතුය. එමඟින් නිදහසේ පක්ෂය තුළ කටයුතු කිරීමටත් පක්ෂ නායකයාගේ ආධිපත්‍ය බිඳදමා කාලෝචිත ප්‍රතිපත්ති අදහස් උදහස්වලට අනුව කටයුතු කිරීමේ හැකියාව ලැබේ.
- පක්ෂයේ ප්‍රභුවාදය බිඳහෙළීම කළ යුතුය. ප්‍රභූ පැළැන්තිය අනුව කටයුතු කිරීමෙන් සාමාන්‍ය ජනතාව පක්ෂය හැරදා යාම නොවැළැක්විය හැකිය. එම නිසා නිර්ප්‍රභුවාදය පක්ෂය අනුගමනය කිරීම වඩාත් කාලෝචිත ය.
- එක්සත් ජාතික පක්ෂයේ අභ්‍යන්තරික අනුකමිටු බුද්ධිමත්, දේශපාලන අවබෝධයක් සහිත පිරිස් වෙතින් ගොඩනැගීම. එසේ සිදු කළහොත් පක්ෂයේ ගැටලු නායකයාගේ අභිරුචිය මත විසඳීම වෙනුවට සර්ව සාධාරණව එම ගැටලු නිරාකරණය කරමින් පක්ෂයේ අනන්‍යතාවය ආරාක්ෂා කරගැනීමට හැකි වීම.
- පක්ෂ ප්‍රතිපත්තිය ශක්තිමත් විය යුතුය. මැතිවරණයෙන් පසු පක්ෂය මාරුකරමින් ජනතා ඡන්දයට අගෞරවයක් ඇති කරන මන්ත්‍රීවරුන්ගේ එම නිලතල අහෝසි වී යන නීති, පක්ෂය මඟින් සකස් කළ යුතුය. එවිට ජනතාවට පක්ෂය පිළිබඳව විශ්වාසයක් ඇති වේ.
- පක්ෂය තුළ පවතින සාමූහිකභාවය ආරාක්ෂා කළ යුතුය. එවිට පක්ෂයේ ප්‍රතිපත්ති, වැඩසටහන් විවේචනය කිරීමට කිසිවෙකු ඉදිරිපත් නොවනු ඇත. විශේෂයෙන්ම මැතිවරණවලදී පොදු පක්ෂය දිනවීමට වඩා පෞද්ගලික පැවැත්ම ගොඩනගා ගැනීමට බොහෝ දෙනෙකුගේ අපේක්ෂාවයි. යහපත් දේශපාලන සංස්කෘතියක් ඇති කළහොත් ග්‍රාමීය ජනතාවගේ වුවද විශ්වාසය ගොඩනැගෙන අතර ඊලග මැතිවරණවලදී ශක්තිමත් දේශපාලන පෞරුෂත්වයක් සහිත නායකයෙකු අවශ්‍ය වේ.
- පක්ෂය තුළ ග්‍රාමීය මට්ටමේ වැඩසටහන් දියත් කරමින් ජනතාව අතරට යෑමට ශක්තිමත් සංවිධාන ව්‍යුහයක් සකස් කළ යුතුය. එවිට ගම් මට්ටමින් සිට ජාතික තලය දක්වා ඡන්ද පදනම සකස් කරගැනීමට හැකියාව පවතී. නායකයින් සාමාන්‍ය ජනතාව අතර පිවිසීම අත්‍යවශ්‍ය වේ. සාමාන්‍ය ජනතාව සමඟ ගැවිසීම, ග්‍රාමීය ජනතාවගේ විශ්වාසය දිනාගැනීම අත්‍යවශ්‍ය වේ.
- කිසිදු විටෙක විරුද්ධවාදී දේශපාලන පක්ෂයක සංඛ්‍යාත්මක අගයන් සන්සන්දනය කරමින් මැතිවරණ ප්‍රචාරණයේ නොයෙදිය යුතුය. ප්‍රබල විරුද්ධ පක්ෂයකට මුහුණ දෙනවායැයි නිරන්තරයෙන්ම සිතා කටයුතු කළ යුතුය.
- සභාග දේශපාලනයට යාම තුළින් පක්ෂයේ වැදගත්කම අඩුවන අතර, අනෙකුත් පක්ෂවල න්‍යාය පත්‍රයට අනුව කටයුතු කිරීමට සිදුවේ. නිදසුනක් වශයෙන් ජනතා විමුක්ති පෙරමුණ සභාග දේශපාලනය තුළ හිඳිමින් පක්ෂයේ ඡන්ද පදනම අවම කරගත් අතර, මෑතකදී ඔවුන් තනිව මැතිවරණවලට ඉදිරිපත් වීම අවසානයේ ජනාධිපතිවරණයෙන් සහ මහමැතිවරණයෙන් ජයගැනීමට හේතු විය. එබැවින් මැතිවරණවලදී හැකිතාක් දුරට සභාග දේශපාලනයෙන් ඈත්ව කටයුතු කිරීමට පක්ෂයේ අරමුණ විය යුතුය.

## ආශ්‍රිත ග්‍රන්ථ

Amarasinghe" R¡Y¡ ^1998&¡ Revolutionary Idealism and Parliamentary Politics ( a Study of

trotskyism in Sri Lanka¡ Colombo 5" Social Scientists Association¡

Burke" E¡ ^1892&¡ Thoughts on the cause of present discontents¡ Cassell and Company Limited¡https://books.google.com/books/about/Thoughts_on_the_Present_Discontents.html?id=7tlNAQAAMAAJ

De Silva" K.M¡ ^1993&¡ Sri Lanka : Problems of Governance¡ New Delhi" Konarak Publishers PVT LTD.

De Silva" K¡M ^1977&¡ Sri Lanka : A Survey¡ London" C¡Hurst and Company ^Publishers& LTD.

De Silva, K.M. (1998). Reaping the whirlwind: Ethnic conflict, ethnic politics in Sri

Lanka. New Delhi: Penguin Books.

De Votta" N¡ ^2014&¡ Parties, political decay, and democratic regression in Sri Lanka¡ Comparative Politics" Vol 25" 139-165, https://scholar.google.com/ scholar?Hlen&as_sdt=0%2C5&as_vis=1&q=parties%2Cpolitical+decay%2Cand+democratic+regression+in+sri+lanka&btnG=#d=gs_qabs&u=%23p%3DK5QPyhHeJgMJ.

Elman"M¡F¡, and Warner"C¡M¡^2008&¡ Democracy, Security and Religious Political Parties ( A Framework for Analysis¡ Vol 4" 1-22" https://www. Tandfonline.com /doi/full/10.1080/14799850701783106¡

Imtiyaz" A.R.M." and Stavis" B¡ ^2008&¡ Ethno-political conflict In Sri Lanka¡ The Journal of Third World Studies, Vol 25" 135-152, https://scholar.google.com/scholar?hl=en&as_sdt=0%2C5&as_vis=1&q=enthno-political+conflict+in+sri+lanka&btnG=#d=gs_qabs&u=%23p%3Duqp66o-6iZ4J.

Johari" J¡C¡ ^2015&¡ Principles of Modern political Science¡ New Delhi" Sterling Publisher Pvt¡ Ltd¡

Madanayake,S¡A¡K¡ ^2017&¡ Unique Features of Foreing Policy of UNP Regimes ^1948-1965& and Bandaranayake Regimes ^1956-1965&¡ 219-227" https://www.researchgate.net/publication/315711629_Unique_Features_of_Foreign_Policy_of_UNP_Regimes_1948_1965_and_Bandaranaike_Regimes_1956_-_1965.

Pennock" R¡J¡ & Smith" D¡G¡ ^1964&¡ Political Science¡ New York" Macmillan Company Limited¡

Ranney" A¡" and Kendall" W¡ ^1956&¡ Political parties; Democracy and the American party system. Harcourt, Brace and Company¡ https://doi.org/10.1002/ncr.4110460313

Snodgrass" D¡R¡ ^1966&¡ Ceylon an export economy in transition" Yale University" Publication of the Economic Growth Center¡

Warnapala" W¡A¡W¡ ^2001&¡ Politics in Sri Lanka¡ Colombo 10" S¡ Godage and Brothers.

Weerawardhana" C¡ ^2015&¡ The Chandrika Bandaranaike factor in Sri Lankan politics, Part I" https://groundviews.org/2015/01/08/the-chandrika-bandaranaike-factor-in-sri-lankan-politics-part-i/^2020/12/19&¡

Wijegoonawardana" N¡ ^2020&¡The Success Ethnically Based Political Parties: Case of Sri Lanka, International Journal of Research, Vol 8" 1-22" 153-163" https: //doi.org/10.29121/granthaalayah.v8.i11.2020.1932¡

Wilson" A¡J¡ ^1979&¡ Political in Sri Lanka¡ New York" The Macmillan Press LTD¡

Woodward, C¡ (1969)¡ The Growth of a Party System in Ceylon¡ Providence" Brown

University Press.

Wriggins" H¡W¡ ^1960&¡ Ceylon ( Dilemmas of a New Nation¡ New Jersey" Princeton University Press¡